රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක : 03/2013

මගේ අංකය : EST-7/LEAVE/03/3183
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2013.08.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**දරු ප්‍රසූතියෙන් පසු රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා ගන්නා නවක නිලධාරිනියන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2005 අනුව ප්‍රසූත නිවාඩු ලබා දීම**

රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීමට පෙර දරු ප්‍රසූතියක් සිදු කර ඇති තැනැත්තියක, රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් බාරගැනීමෙන් පසු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2005 විධිවිධාන පරිදි ප්‍රසූත නිවාඩු ලබා දීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ විවිධ විමසීම් මා වෙත ලැබී ඇත. එවැනි අවස්ථාවන්හි දී පහත පරිදි ක්‍රියා කළ යුතුය.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2005 හි විධිවිධාන අනුව රජයේ නිලධාරිනියකට ප්‍රසූත නිවාඩු ලබාදෙනුයේ දරුවාගේ පෝෂණය හා රැකවරණය උදෙසා වේ. එබැවින් දරු උපත සිදු වූ දින සිට නවක නිලධාරිනිය වැඩ බාරගත් දිනය දක්වා වූ කාල සීමාවට ගැනෙන දින ගණන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2005 හි විධිවිධාන අනුව වැටුප් සහිතව ලබාදෙනු ලබන දින 84ක ප්‍රසූත නිවාඩු කාල සීමාවෙන් අඩු කර ඉතිරි කාල සීමාව එම චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කරමින් වැටුප් සහිත නිවාඩු ලෙස ලබා දිය හැකිය.

03. ඉහත පරිදි ගණනය කිරීමෙන් පසු නිලධාරිනියට හිමිකම් ඇත්තේ අඩවැටුප් හෝ වැටුප් රහිත නිවාඩු සඳහා නම් එම නිවාඩු ද නිලධාරිනියගේ ඉල්ලීම පරිදි ලබා දිය හැකිය.

04. දරු ප්‍රසූතියකින් අනතුරුව රාජ්‍ය සේවයට නව පත්වීම් ලබා, මෙතෙක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2005 අනුව වැටුප් සහිත, අඩවැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබාගත හැකි කාල සීමාව නොඉක්මවූ නිලධාරිනියක් සම්බන්ධයෙන් ඉහත උපදෙස්වලට පරිබාහිර ආකාරයට දී ඇති නිවාඩු අවශ්‍ය ගැලපීම් කර සංශෝධනය කළ හැකි බව ද වැඩි දුරටත් දන්වමි.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය